# හි න් දී ශාස්ත්‍රීය සංග්‍රහය

උපදේශක සංස්කාරක: මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු
ප්‍රධාන සංස්කාරක: උපුල් රංජිත් හේවාවිතානගමගේ
සංස්කාරකවරු: ආචාර්ය ඉන්ද්‍රා දසනායක
ලක්ෂ්මන් සෙනෙවිරත්න
අනුෂා නිල්මිණි සල්වතුර

ප්‍රථම කලාපය, 1998, හින්දි අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

ඩබ්ලිව්. එස්. කරුණාතිලක

කැලණිය විශ්වවිද්‍යාලයෙහි හින්දි අධ්‍යයනාංශය මගින් ප්‍රකාශයට පත්කරන ලද ප්‍රථම ශාස්ත්‍රීය සංග්‍රහය වන මෙම කලාපය ශාස්ත්‍රීය ලිපි දහහතරකින් සමන්විත වී ඇත්තේය.

මෙහි පළමුවන ලිපිය ඉන්දියානු නවකතාව, නිදහස් සටන සහ දේශීය අනන්‍යතාව යන මැයෙන් මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු මහතා විසින් ලියන ලද්දකි. භාරතයේ පැවති කථා කීමේ ආවේණික සම්ප්‍රදාය පිළිබඳ ප්‍රෞඪ විමර්ශනයකින් අනතුරුව නව මුහුණුවරකින් දැක්වෙන ඉන්දියානු නවකතාවෙහි ප්‍රභවය හා වර්ධනයට හේතු සාධක වී යැයි සැලකෙන කරුණු පිළිබඳව පෙර'පර දෙදිග විචාරක මත ඇසුරින් මෙහි කරුණු දැක්වෙයි. සැපී පෙනෙන භාරතීය නවකතාකරුවන් කිහිප දෙනෙකුගේ ම කෘති පාදක කරගනිමින් ඉන්දීය නවකතාවෙහි පොදුහරය හා ප්‍රාවර්තනික උපනති කෙබඳුදැයි නතුවරයා විචක්ෂණ ලෙස පැහැදිලි කර දී ඇත.

මෙහි දෙවන ලිපිය සිංහල හා හින්දි ස්වරනාසිකීකරණය

---

© ඩබ්ලිව්. එස්. කරුණාතිලක
කඳුරුගොඩුවේ නාසිත හිමි, මැණික් ගුණසේකර, නිමල් පරවාතුර, උපුල් රංජිත් හේවාවිතානගමගේ සංස්., 1999, මානව ශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, කැලණිය විශ්වවිද්‍යාලය.